රුහුණ විශ්වවිද්‍යාලය
றுஹுணு பல்கலைக்கழகம்
UNIVERSITY OF RUHUNA

මගේ අංකය / எனது எண் / My No. RU/NE/04
ඔබේ අංකය / உங்களது எண் / Your No.

වැල්ලමඩම මාතර 81000 ශ්‍රී ලංකාව வெல்லமடம மாத்தறை 81000 இலங்கை WELLAMADAMA, MATARA 81000 SRI LANKA

2026.01.14

පීඨාධිපති ( වෛද්‍ය / කෘෂි/ විද්‍යා/ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා/ ඉංජිනේරු/ කළමනාකරණ හා මූල්‍ය/ ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ/ පශ්චාද් උපාධි/ තාක්ෂණ/ සම සෞඛ්‍ය) පීඨය,

පුස්තකාලයාධිපති,

<u>අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ ශ්‍රේණි උසස්වීම් - 2025</u>

මෙම විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන තනතුරු වල ශ්‍රේණි උසස්වීම් සිදු කිරීම සඳහා අයදුම්පත් කැඳවමින් නිකුත් කර ඇති දැන්වීම් සහ අදාළ අයදුම්පත් මේ සමග එවා ඇත.

එම දැන්වීම ඔබ පීඨයේ අධ්‍යයනාංශ හා අංශවල සියලුම අනධ්‍යයන සේවකයන්ට දැන ගැනීමට සලස්වන මෙන් කරුණාවෙන් ඉල්ලමි.

එච්.ජී. නිලන්ති දේවිකා
නියෝජ්‍ය ලේඛකාධිකාරී
අනධ්‍යයන ආයතන අංශය

# රුහුණ විශ්වවිද්‍යාලය

**රුහුණ විශ්වවිද්‍යාලයේ සියලුම පීඨාධිපතිවරුන්,**
**සියලුම අධ්‍යයනාංශ /අංශ ප්‍රධාන මගින්,**
**සුදුසුකම්ලත් විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය වෙත.**

පහත සඳහන් තනතුරුවලට උසස් කිරීම සලකා බැලීම සඳහා **2025.12.31** දිනට සුදුසුකම් ඇති රුහුණ විශ්වවිද්‍යාලයේ ස්ථිර තනතුරුවල සේවය කරන අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සුදුසුකම් සපුරා ඇති අය ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කළ අයදුම්පත්‍රයක් **2026.01.30** වන දින හෝ ඊට පෙර නියෝජ්‍ය ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන) වෙත භාරදිය යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් කර නොමැති හෝ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අනෙකුත් නියමිත අවශ්‍යතාවන් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ අයුරින් ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් ගැන නැවත සළකා බලනු නොලැබේ.

**01. <u>පූර්ණකාලීන උපශාලාධිපති (විශේෂ ශ්‍රේණිය)</u>**

I ශ්‍රේණියේ පූර්ණකාලීන උපශාලාධිපති තනතුරේ වසර 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

හෝ

පැරණි පරිපාටිය යටතේ උපශාලාධිපති (I ශ්‍රේණිය) ට උසස් වූ අය සඳහා වසර 09 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**02. <u>පූර්ණකාලීන උපශාලාධිපති (I ශ්‍රේණිය)</u>**

II ශ්‍රේණියේ පූර්ණකාලීන උපශාලාධිපති තනතුරේ වසර 06 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**03. <u>තාක්ෂණික නිලධාරී (II ශ්‍රේණිය) "අ" ඛණ්ඩය</u>**

සේවයේ තහවුරු කරන ලද තාක්ෂණික නිලධාරී II ශ්‍රේණියේ "ආ" ඛණ්ඩය තනතුරේ වසර 06 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**04. <u>තාක්ෂණික නිලධාරී (I ශ්‍රේණිය)</u>**

ජාතික තාක්ෂණික විද්‍යා ඩිප්ලෝමා සුදුසුකම් ලැබීමෙන් පසුව 2025.12.31 දින වන විට වර්ෂ 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති II ශ්‍රේණියේ තාක්ෂණික නිලධාරියෙකු වීම

හෝ

තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය තනතුරේ වසර 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**05. <u>මාණ්ඩලික තාක්ෂණික නිලධාරී (II ශ්‍රේණිය)</u>**

තාක්ෂණික නිලධාරී I ශ්‍රේණිය තනතුරේ වසර 04 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**06. <u>මාණ්ඩලික තාක්ෂණික නිලධාරී (I ශ්‍රේණිය)</u>**

මාණ්ඩලික තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**07. මාණ්ඩලික සහකාර (දුරකථන ක්‍රියාකරු/අමුත්තන් පිළිගැනීමේ නිලධාරී)**

දුරකථන ක්‍රියාකරු / අමුත්තන් පිළිගැනීමේ නිලධාරී (අධි ශ්‍රේණිය) තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**08. දුරකථන ක්‍රියාකරු/අමුත්තන් පිළිගැනීමේ නිලධාරී (අධි ශ්‍රේණිය)**

I ශ්‍රේණියේ දුරකථන ක්‍රියාකරු / අමුත්තන් පිළිගැනීමේ නිලධාරී තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**09. දුරකථන ක්‍රියාකරු/අමුත්තන් පිළිගැනීමේ නිලධාරී (I ශ්‍රේණිය)**

II ශ්‍රේණියේ දුරකථන ක්‍රියාකරු / අමුත්තන් පිළිගැනීමේ නිලධාරී තනතුරේ වසර 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**10. ආරක්ෂක සේවා පරීක්ෂක (විශේෂ ශ්‍රේණිය)**

I ශ්‍රේණියේ ආරක්ෂක සේවා පරීක්ෂකවරයෙකු වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**11. ආරක්ෂක සේවා පරීක්ෂක (I ශ්‍රේණිය)**

II ශ්‍රේණියේ ආරක්ෂක සේවා පරීක්ෂකවරයෙකු වශයෙන් වසර 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**12. ආරක්ෂක නියාමක (අධි ශ්‍රේණිය)**

විශ්වවිද්‍යාල සේවයේ ආරක්ෂක නියාමක (ඉහළ ශ්‍රේණිය) තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**13. ආරක්ෂක නියාමක (ඉහළ ශ්‍රේණිය)**

විශ්වවිද්‍යාල සේවයේ ආරක්ෂක නියාමක (පහළ ශ්‍රේණිය) තනතුරේ ස්ථිර සේවයේ වසර 07ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**14. රියදුරු (විශේෂ ශ්‍රේණිය)**

රියදුරු තනතුරේ වසර 15 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඉන් අවම වශයෙන් වසර 05 ක් රියදුරු I ශ්‍රේණියේ තනතුරේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**15. රියදුරු (I ශ්‍රේණිය)**

II වන ශ්‍රේණියේ රියදුරු තනතුරේ වසර 09 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**16. ජලනල කාර්මික (විශේෂ ශ්‍රේණිය)**

I වන ශ්‍රේණියේ ජලනල කාර්මිකයෙකු වශයෙන් වසර 07 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**17. ජලනල කාර්මික (I ශ්‍රේණිය)**

II වන ශ්‍රේණියේ ජලනල කාර්මිකයෙකු වශයෙන් වසර 09 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**18. විදුලි කාර්මික (විශේෂ ශ්‍රේණිය)**

I වන ශ්‍රේණියේ විදුලි කාර්මිකයෙකු වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**19. විදුලි කාර්මික (I ශ්‍රේණිය)**

II වන ශ්‍රේණියේ විදුලි කාර්මිකයෙකු වශයෙන් වසර 09 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**20. ත්‍රීරෝද රථ රියදුරු (I ශ්‍රේණිය)**

II ශ්‍රේණියේ ත්‍රීරෝද රථ රියදුරුවරයෙකු වශයෙන් වසර 09 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**21. වඩු කාර්මික (විශේෂ ශ්‍රේණිය)**

I ශ්‍රේණියේ වඩු කාර්මිකවරයෙකු වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**22. වඩු කාර්මික ( I ශ්‍රේණිය)**

II ශ්‍රේණියේ වඩු කාර්මිකවරයෙකු වශයෙන් වසර 09 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**23. පෙදරේරු (විශේෂ ශ්‍රේණිය)**

I ශ්‍රේණියේ පෙදරේරුවරයෙකු වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**24. පෙදරේරු (I ශ්‍රේණිය)**

II ශ්‍රේණියේ පෙදරේරුවරයෙකු වශයෙන් වසර 09 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**25. විද්‍යාගාර සහායක (විශේෂ ශ්‍රේණිය)**

අධි ශ්‍රේණියේ විද්‍යාගාර සහායකයෙකු වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**26. විද්‍යාගාර සහායක (අධි ශ්‍රේණිය) / විද්‍යාගාර සහායක - I ශ්‍රේණිය**

ඉහළ ශ්‍රේණියේ විද්‍යාගාර සහායකයෙකු වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**27. විද්‍යාගාර සහායක (ඉහළ ශ්‍රේණිය) / විද්‍යාගාර සහායක - II ශ්‍රේණිය**

පහළ ශ්‍රේණියේ විද්‍යාගාර සහායකයෙකු වශයෙන් වසර 08 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**28. පුස්තකාල සේවක (විශේෂ ශ්‍රේණිය)**

පුස්තකාල සේවකයෙකු වශයෙන් වසර 15 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, ඉන් වසර 05 ක් I වන ශ්‍රේණියේ පුස්තකාල සේවකයෙකු වශයෙන් සේවය කර තිබීම.

**29. පුස්තකාල සේවක (I ශ්‍රේණිය)**

II වන ශ්‍රේණියේ පුස්තකාල සේවකයෙකු වශයෙන් වසර 09 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**30. සෞඛ්‍ය සේවා උපස්ථායක (විශේෂ ශ්‍රේණිය)**

ඉහළ ශ්‍රේණියේ සෞඛ්‍ය සේවා උපස්ථායක වශයෙන් වසර 07 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**31. සෞඛ්‍ය සේවා උපස්ථායක (ඉහළ ශ්‍රේණිය)**

පහළ ශ්‍රේණියේ සෞඛ්‍ය සේවා උපස්ථායක වශයෙන් වසර 08 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**32. වැඩ සහායක (විශේෂ ශ්‍රේණිය)**

I වන ශ්‍රේණියේ වැඩ සහායකයෙකු වශයෙන් වසර 07 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**33. වැඩ සහායක (I ශ්‍රේණිය)**

II වන ශ්‍රේණියේ වැඩ සහායකයෙකු වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**34. වැඩ සහායක (II ශ්‍රේණිය)**

III වන ශ්‍රේණියේ වැඩ සහායකයෙකු වශයෙන් වසර 10 ක සතුටුදායක සේවා කාලයක සම්පූර්ණ කර තිබීම.

**35. සෞඛ්‍ය සේවා කම්කරු (විශේෂ ශ්‍රේණිය)**

ඉහළ ශ්‍රේණියේ සෞඛ්‍ය සේවා කම්කරුවෙකු වශයෙන් වසර 07 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**36. සෞඛ්‍ය සේවා කම්කරු (ඉහළ ශ්‍රේණිය)**

පහළ ශ්‍රේණියේ සෞඛ්‍ය සේවා කම්කරුවෙකු වශයෙන් වසර 08 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සැ.යු : මෙම තනතුරු උසස්වීම්වලට අමතරව වෙනත් තනතුරුවල උසස්වීම්වලට ද මූලික සුදුසුකම් ඇති සේවක භවතුන් වෙතොත් ඒ සඳහා 2026.01.30 දිනට පෙර ඉදිරිපත් කරන අයදුම්පත්‍ර ද සලකා බලනු ලැබේ.**

**සී. සෙනෙවිරත්න**
**වැඩ බලන ලේඛකාධිකාරී**
**2026.01.13**

# රුහුණ විශ්වවිද්‍යාලය

**රුහුණ විශ්වවිද්‍යාලයේ සියලුම පීඨාධිපතිවරුන්,**
**සියළුම අධ්‍යයනාංශ / අංශ ප්‍රධාන මඟින්,**
**සුදුසුකම්ලත් විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය වෙත.**

පහත සඳහන් තනතුරු වලට උසස් කිරීම සලකා බැලීම සඳහා 2025.12.31 දින දක්වා සුදුසුකම් සපුරා ඇති රුහුණ විශ්වවවිද්‍යාලයේ ස්ථිර තනතුරුවල සේවය කරන අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සුදුසුකම් සපුරා ඇති සේවක භවතුන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කළ අයදුම්පත්‍රයක් 2026.01.30 වන දින හෝ ඊට පෙර නියෝජ්‍ය ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන) වෙත භාරදිය යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් කර නොමැති හෝ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අනෙකුත් නියමිත අවශ්‍යතාවන් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ අයුරින් ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් ගැන නැවත සළකා බලනු නොලැබේ.

(i) **<u>කළමනාකරණ සහකාර (II ශ්‍රේණිය) තනතුරට උසස් කිරීම.</u>**

III ශ්‍රේණියේ කළමනාකරණ සහකාර තනතුරක සේවයේ ස්ථිර කරන ලදුව 2025.12.31 දින වන විට වර්ෂ 10 ක (අනියම් හෝ තාවකාලික සේවය හැර) ස්ථිර සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති තැනැත්තන්.

(ii) **<u>කළමනාකරණ සහකාර (I ශ්‍රේණිය) තනතුරට උසස් කිරීම.</u>**

2025.12.31 දින වන විට කළමනාකරණ සහකාර තනතුරක වර්ෂ 11 ක ස්ථිර සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඉන් අවම වර්ෂ 3 ක් II ශ්‍රේණියේ කළමනාකරණ සහකාර තනතුරක සේවය කර ඇති තැනැත්තන්.

(iii) **<u>මාණ්ඩලික කළමනාකරණ සහකාර තනතුරට උසස් කිරීම.</u>**

2025.12.31 දින වන විට I ශ්‍රේණියේ කළමනාකරණ සහකාර තනතුරක වර්ෂ 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති තැනැත්තන්,

(iv) **<u>ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කළමනාකරණ සහකාර තනතුරට උසස් කිරීම.</u>**

2025.12.31 දින වන විට මාණ්ඩලික කළමනාකරණ සහකාර තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) **<u>කළමනාකරණ සහකාර (II ශ්‍රේණිය) (ගබඩා භාරකරු/සරප්/පොත් තබන්නා) තනතුරට උසස් කිරීම.</u>**

III ශ්‍රේණියේ කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු/සරප්/පොත් තබන්නා) තනතුරුවල සේවයේ ස්ථිර කරන ලදුව 2025.12.31 දින වන විට වර්ෂ 10 ක (අනියම් හෝ තාවකාලික සේවය හැර) ස්ථිර සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති තැනැත්තන්.

(vi) **<u>කළමනාකරණ සහකාර (I ශ්‍රේණිය) (ගබඩා භාරකරු/සරප්/පොත් තබන්නා) තනතුරට උසස් කිරීම.</u>**

2025.12.31 දින වන විට කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු/සරප්/පොත් තබන්නා) තනතුරක වර්ෂ 11 ක ස්ථිර සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඉන් අවම වර්ෂ 3 ක් II ශ්‍රේණියේ තනතුරක සේවය කර ඇති තැනැත්තන්.

(vii) **<u>මාණ්ඩලික කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු/සරප්/පොත් තබන්නා) තනතුරට උසස් කිරීම.</u>**

2025.12.31 දින වන විට I ශ්‍රේණියේ කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු/සරප්/පොත් තබන්නා) තනතුරක වර්ෂ 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති තැනැත්තන්,

(viii) **<u>ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු/සරප්/පොත් තබන්නා).</u>**

2025.12.31 දින වන විට මාණ්ඩලික සහකාර කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු /සරප් / පොත් තබන්නා) තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ix) **<u>පුස්තකාල තොරතුරු සහකාර (II ශ්‍රේණිය) තනතුරුවලට උසස් කිරීම.</u>**

(i) III ශ්‍රේණියේ පුස්තකාල තොරතුරු සහකාර තනතුරුවල සේවයේ ස්ථිර කරන ලදුව 2025.12.31 දින වන විට වර්ෂ 06 ක ස්ථිර සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති,

(අ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ I වැනි පරීක්ෂණය හෝ සමාන පරීක්ෂණයක් සමත් තැනැත්තන්
(ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනය මගින් පවත්වනු ලබන තුන්අවුරුදු අර්ධකාලීන පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රාරම්භක (පළමු වසර) විභාගය ද ඉහත සඳහන් සමාන පරීක්ෂණයක් සේ සලකනු ලැබේ.)

හෝ

(ආ) කැලණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු අදියර සමත් තැනැත්තන්.

හෝ

(ඇ) යාපනය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කළ තැනැත්තන්.

(ii) III ශ්‍රේණියේ පුස්තකාල තොරතුරු සහකාර තනතුරුවල සේවයේ ස්ථිර කරන ලදුව 2025.12.31 දින වන විට වර්ෂ 10 ක ස්ථිර සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති තැනැත්තන්.

(x) **<u>පුස්තකාල තොරතුරු සහකාර (I ශ්‍රේණිය) තනතුරට උසස් කිරීම.</u>**

2025.12.31 දින වන විට පුස්තකාල තොරතුරු සහකාර තනතුරක වර්ෂ 11 ක ස්ථිර සතුටුදායක සේවා කාලයක් (අනියම් හෝ තාවකාලික සේවය හැර) සම්පූර්ණ කර ඉන් අවම වර්ෂ 3 ක් II ශ්‍රේණියේ තනතුරක සේවය කර ඇති තැනැත්තන්.

(xi) **<u>මාණ්ඩලික සහකාර (පුස්තකාල සේවා) තනතුරට උසස් කිරීම.</u>**

2025.12.31 දින වන විට පුස්තකාල තොරතුරු සහකාර (I ශ්‍රේණිය) තනතුරක වර්ෂ 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති තැනැත්තන්.

(xii) **<u>ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (පුස්තකාල සේවා) තනතුරට උසස් කිරීම.</u>**

2025.12.31 දින වන විට, මාණ්ඩලික සහකාර (පුස්තකාල සේවා), තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2018, 12/2018 හා 13/2019 අනුව කළමනාකරණ සහකාර ලෙස තනතුරු නාම පරිවර්තනය කිරීමට පෙර දරමින් සිටි තනතුරු වල සේවා කාලයද මෙම උසස්වීම් වල සුදුසුකම් සඳහා සැලකිල්ලට ගනු ලැබේ.

ඉහත සුදුසුකම් සපුරා ඇති අය ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කළ අයදුම්පත්‍රයක් 2026.01.30 දින හෝ ඊට ප්‍රථම නියෝජ්‍ය ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන) වෙත තම අංශ ප්‍රධාන / අධ්‍යයනාංශ ප්‍රධාන නිර්දේශය සහිතව එවිය යුතුය.

සී.සෙනෙවිරත්න
වැඩ බලන ලේඛකාධිකාරි
2026.01.13

## ශ්‍රේණි උසස්වීම් අයදුම් පත

**...................................................... ශ්‍රේණියට උසස් කිරීම - 2025**

01. අයදුම්කරුගේ නම :

02. දුරකථන අංකය :

02. තනතුරෙහි තහවුරු කර තිබේද ? : ඇත ☐ නැත ☐

03. වර්තමාන සේවා ස්ථානය :

04. වර්තමාන තනතුර : ශ්‍රේණිය :
වර්තමාන තනතුරට පත් වූ දිනය :

05. උසස්වීමට අපේක්ෂිත තනතුර හා ශ්‍රේණිය :

06. වර්තමාන තනතුරේ දරණ ලද ශ්‍රේණි :

| **ශ්‍රේණිය** | **පත් වූ දිනය / උසස් වූ දිනය** |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

07. විශ්වවිද්‍යාල සේවයට බැඳුනු දින සිට සේවා විස්තර :

| **විශ්වවිද්‍යාලය/ආයතනය** | **තනතුර** | **සේවා කාලය** | |
|---|---|---|---|
| | | **සිට** | **දක්වා** |
| | | | |

08. ඔබේ රාජකාරී කටයුතු පිළිබඳ ලුහුඬු විස්තරයක්: (අංශ ප්‍රධාන අත්සන සහිත රාජකාරී ලැයිස්තුවක් අමුණන්න.)

09. අදාල වෙනත් විස්තර :

10. රැකියාවක් හෝ අධ්‍යයන කටයුතු සඳහා වැටුප් රහිත විදේශීය නිවාඩු ලබාගෙන තිබේද?

11. එසේ නිවාඩු ලබාගෙන තිබේනම් නිවාඩු ආරම්භ වූ සහ අවසන් වූ දින සඳහන් කරන්න.

මාගේ දැනීමේ හැටියට ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කර සිටිමි. එම විස්තර අසත්‍ය හෝ වැරදි බව ඉහත දැක්වෙන ශ්‍රේණියට මා උසස් වීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් මාගේ උසස්වීම අවලංගු වීමට යටත් වන බව මම හොඳාකාරවම දනිමි.

දිනය : ............................ ..................................................

අයදුම්කරුගේ අත්සන

ලේඛකාධිකාරී,
රුහුණ විශ්වවිද්‍යාලය.

මෙම අයදුම්කරු උසස් කිරීම සඳහා මම නිර්දේශ කරමි/නොකරමි.

අයදුම්පත්‍රය සමඟ අමුණා ඇති රාජකාරී කටයුතු පිළිබඳ ලේඛනය නිවැරදි බව සහතික කරමි.

දිනය : ................................... .............................................................

අධ්‍යයනාංශ/අංශ ප්‍රධාන

අධ්‍යයනාංශය/ශාඛාව : .........................................................................................

## තාක්ෂණික නිලධාරී ශ්‍රේණි උසස් වීම් අයදුම් පත්‍රය 2025

**........................................................................ තනතුරට උසස් වීම**

01. අයදුම්කරුගේ නම :

02. දුරකථන අංකය :

03. වර්තමාන සේවා ස්ථානය :

04. පුහුණුවන තාක්ෂණික නිලධාරී තනතුරට පත් වූ දිනය :

05. (අ) II ශ්‍රේණිය "ආ" ඛණ්ඩයේ තාක්ෂණික නිලධාරී තනතුරට පත් වූ දිනය :

(ආ) II ශ්‍රේණිය "අ" ඛණ්ඩයට උසස් වූ දිනය :

06. I ශ්‍රේණියට උසස් වූ දිනය :

07. මාණ්ඩලික තාක්ෂණික නිලධාරී II ශ්‍රේණියට උසස් වූ දිනය :

08. තනතුරේ ස්ථිර කර තිබේද? ඇත ☐ නැත ☐

09. විශ්වවිද්‍යාල සේවයට බැඳුනු දින සිට සේවා විස්තර :

| විශ්වවිද්‍යාලය/ආයතනය | තනතුර | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

10. ඔබේ රාජකාරි කටයුතු පිළිබඳ ලුහුඬු විස්තරයක් :(අංශ ප්‍රධාන අත්සන සහිත රාජකාරි ලැයිස්තුවක් අමුණන්න.)

11. අදාල වෙනත් විස්තර :

12. රැකියාවක් හෝ අධ්‍යයනය කටයුතු සඳහා වැටුප් රහිත විදේශීය නිවාඩු ලබාගෙන තිබේද?

13. එසේ නිවාඩු ලබාගෙන තිබේනම් නිවාඩු ආරම්භ වූ සහ අවසන් වූ දින සඳහන් කරන්න.

මාගේ දැනීමේ හැටියට ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කර සිටිමි. එම විස්තර අසත්‍ය හෝ වැරදි බව ඉහත දැක්වෙන ශ්‍රේණියට මා උසස් වීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් මාගේ උසස්වීම අවලංගු වීමට යටත් වන බව මම හොඳාකාරවම දනිමි.

දිනය : ............................. ......................................................

අයදුම්කරුගේ අත්සන

ලේඛකාධිකාරී,
රුහුණ විශ්වවිද්‍යාලය.

මෙම අයදුම්කරු උසස් කිරීම සඳහා මම නිර්දේශ කරමි/නොකරමි.

අයදුම් පත්‍රයේ අංක 10 යටතේ දක්වා ඇති රාජකාරි කටයුතු පිළිබඳ ලුහුඬු විස්තරය නිවැරදි බව සහතික කරමි.

දිනය :- ................................. ..........................................................

අධ්‍යයනාංශ/අංශ ප්‍රධාන

අධ්‍යයනාංශය/ශාඛාව :- ........................................................................................